## කෘෂිකර්ම අමාත්‍යාංශය

# වී අලෙවි මණ්ඩලය

# තනතුරු පුරප්පාඩු

වී අලෙවි මණ්ඩලයේ පුරප්පාඩුව පවතින ගණකාධිකාරී,නීති නිලධාරී/අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් සහ ගිණුම් සහකාර තනතුරු පිරවීම සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරාලන ලද අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### (01.) ගණකාධිකාරී- (MM 1- 1 ) (11 ශ්‍රේණිය) - තනතුරු 01 යි

**(අ.) සුදුසුකම්**

1. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (ICASL) අන්තර් මධ්‍යම පරීක්ෂණයෙන් සමත් වීම

හෝ

2. එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (CIMA) අන්තර් මධ්‍ය පරීක්ෂණය සමත්වීම

හෝ

3. එක්සත් රාජධානියේ වරලත් සහතික ලත් ගණකාධිකාරීන්ගේ සංගමයේ (ACCA) අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත්වීම

හෝ

4. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක කළමනාකරණය හෝ වාණිජවේදී උපාධිය

හෝ

5. උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමාව

සමග

6. රජයේ දෙපාර්තුමේන්තු,සංස්ථා,මණ්ඩල හෝ පිළිගත් වෙළඳ ආයතනයක ගිණුම් හා මූල්‍ය කටයුතු පිළිබඳව වර්ෂ තුන (03) කට නොඅඩු සේවා පළපුරුද්දක් තිබීම.

**(ආ.) වෙනත් සුදුසුකම්**

ඉංග්‍රීසි භාෂාව සම්බන්ධ මනා පරිචය සහ පරිගණක භාවිතය පිළිබඳ ප්‍රවීණතාවය,පරිපාලනය, කළමනාකරණය, අලෙවි ප්‍රවර්ධනය හා ප්‍රචාරණය යන විෂයයන් සම්බන්ධයෙන් වන දැනුම කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

**(ඇ.) වැටුප් පරිමාණය** - MM 1-1 2016, රු.53,175 -10X1,375 - 15X1,910 - රු.95,575

**(ඈ.) වයස් සීමාව** - අවුරුදු 25 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුයි.

(අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.)

### (02.) නීති නිලධාරී / අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් - (MM 1- 1 ) (11 ශ්‍රේණිය) - තනතුරු 01 යි

**(අ.) සුදුසුකම්**

1. ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් නීතිවේදී උපාධියක් සහිත ශ්‍රී ලංකා නීති විද්‍යාලය මගින් පිරිනමනු ලබන නීතිවේදී පාඨමාලාව හදාරා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු ලෙස දිවුරුම් දී ඇති අයෙකු වීම

සමග

2. රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය අංශයේ ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර දෙක (02) ක පළපුරුද්ද සහිත වීම

හෝ

3. වෘත්තීය නීතිවේදියෙකු වශයෙන් වසර තුන (03) ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**(ආ.) වෙනත් සුදුසුකම්**

ඉංග්‍රීසි භාෂාව සම්බන්ධ මනා පරිචය සහ පරිගණක භාවිතය පිළිබඳ ප්‍රවීණතාවය කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

**(ඇ.) වැටුප් ක්‍රමය**

MM 1-1 2016-රු.53,175 -10X1,375 - 15X1,910 -රු. 95,575

**(ඈ.) වයස් සීමාව**

අවුරුදු 25ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුයි. (අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.)

### (03.) ගිණුම් සහකාර - (MA 2 - 1) (111 ශ්‍රේණිය) - තනතුරු 01 යි

**(අ.) අධ්‍යාපන සුදුසුකම්**

(1.) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී,

- i. භාෂාව
- ii. ගණිතය
- iii. ඉංග්‍රීසි ඇතුළු විෂයයන් 04 කට සම්මාන සහිතව විෂයයන් 06 ක් සමත් වී තිබීම.

(2.) අධ්‍යයන පොදු සහතික පත්‍ර ( උසස් පෙළ) විභාගයෙන් විෂයයන් 03 ක් එකවර සමත් වීම.

(3.) ගණකාධිකාරී ශිල්පීය ආයතනයේ අවසන් පරීක්ෂණය සමත් වීම. (AAT)

(4.) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ පදනම් වසර සමත් වීම. (ICASL)

**(ආ.) තාක්ෂණික නිපුණතා / ප්‍රවීණතා පළපුරුද්ද**

(1.) පරිගණක ප්‍රවීණතාවය සඳහා පිළිගත් ආයතනයක් මගින් ලබා ගත් සහතිකයක් හා අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

(2.) දැනටමත් රාජ්‍ය කළමනාකරණ සේවයේ නියුතු ඉහත සුදුසුකම් සපුරා ඇති නිලධාරීන් කෙරෙහි සැලකිල්ලක් දක්වනු ලැබේ.

**(ඇ.) වෙනත් සුදුසුකම්**

ලඝු ලේඛනය (සිංහල හා ඉංග්‍රීසි භාෂා දැනුම) විශේෂ සුදුසුකමක් සේ සැලකේ.

**(ඈ.) වැටුප් ක්‍රමය**

MA 2 - 1 - 2016, රු.30,310- 10X300- 07X350 - 04X495 - 20X660 -රු. 50,940

**(ඉ.) වයස් සීමාව**

අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුයි.

(අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

**(04.)**

- මෙම සේවාවල / තනතුරුවල බාහිර අයදුම්කරුවන් අතුරින් පත් කරනු ලබන නිලධාරියෙකු වසර තුන (03) ක පරිවාස කාලයකටද,දැනටමත් ආයතනික සේවයේ කිසියම් තනතුරක ස්ථිර කරනු ලැබ ඇති අභ්‍යන්තර අයදුම්කරුවන් එක් අවුරුදු වැඩ බැලීමේ පරීක්ෂණ කාලසීමාවකටද යටත් කරනු ලැබේ.
- මෙම සේවාවල / තනතුරුවල බාහිර අයදුම්කරුවන් අතුරින් බඳවා ගැනීමේදී අදාළ තැනැත්තා වැටුප් පරිමාණයේ ආරම්භක පියවරෙහි පිහිටුවනු ලබන අතර, අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීමේදී පිහිටුවනු ලැබිය යුතු වැටුප් පියවර ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ විධිවිධාන අනුව සිදු කරනු ලැබේ.
- මෙම තනතුරු සේවක අර්ථසාධක අරමුදලට හා සේවා දයකයින්ගේ භාරකාර අරමුදල් සඳහා හිමිකම් සහිත වන අතර, රජය විසින් අනුමත අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ.
- අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට මූලික සුදුසුකම් සපුරා තිබිය යුතුය.
- ජීව දත්ත තොරතුරු ඇතුළත් තමා විසින් සකස් කර ගන්නා ලද අයදුම්පතක් අදාළ අධ්‍යාපන,වෘත්තීය හා අනෙකුත් සුදුසුකම් තහවුරු කිරීම සඳහා එකී ලේඛනවල සහතික කරන ලද පිටපත් සහිතව ඥාතීන් නොවන දෙදෙනෙකුගේ තොරතුරු ඇතුළත්ව **2021.08.23 දිනට පෙර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පරිපාලන),වී අලෙවි මණ්ඩලය, 6 වන මහල, නිවාස මහලේකම් ගොඩනැගිල්ල,සර් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02.** ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ඔබගේ අයදුම්පත් යොමුකළ යුතු අතර, ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරෙහි ඉල්ලුම් කරන තනතුරු නාමය සඳහන් කළ යුතුය.
- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගැනීම් සිදු කෙරේ.
- පත්වීම් සම්බන්ධයෙන් බලපෑම් කිරීම / සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම හා විධිමත් ලෙස අයදුම්පත් ඉදිරිපත් නොකිරීම නුසුදුස්සෙකු වීමට හේතුවේ.
- සෑම අයදුම්කරුවෙක්ම ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
- පත්වීම් සම්බන්ධයෙන් අවසාන තීරණය වී අලෙවි මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය සතුවේ.

**සභාපති,**
**වී අලෙවි මණ්ඩලය.**